**ශීර්ෂය - 277 මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 277- මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 15 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 584.00 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 577.23 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.77 ක් හෙවත් සියයට 1.16 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 464.00 | 458.73 | 5.27 | 1.14 |
| මූලධන | 120.00 | 118.50 | 1.50 | 1.25 |
| **එකතුව** | **584.00** | **577.23** | **6.77** | **1.16** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 22 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.මිලියන 1,624 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,356 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදන වලින් රු. මිලියන 268 ක් හෙවත් සියයට 16.50 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 34.00 | 33.78 | 28.00 | 32.61 | 125.00 | 92.16 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 111.56 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0079/000 | 25.63 |
| 6000/0000/00/0016/0027/000 | 83.93 |
| 6000/0000/00/0018/0038/000 | 1.90 |
| 6000/0000/00/0001/0060/000 | 0.01 |
| 6000/0000/00/0017/0000/000 | 0.09 |
| **එකතුව** | **111.56** |

## 2.4 විගණන නිරීක්ෂණය

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

## 3.1 විගණන සාක්ෂි නොවීම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෙවනගල ප්‍රජාමූල බැංකුව විසින් ණය ඉල්ලුම්කරුවන් 11 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.3,250,000 ණයවලට අදාළ ණය ඉල්ලුම්පත්, ගිවිසුම්, පාලක මණ්ඩල අනුමැතිය, ගෙවීම් වවුචර්, ණය කාඩ්පත් ආදි ලිපිලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සෙවනගල ප්‍රජාමූල බැංකුව විසින් නිකුත් කර තිබුණු රු.300,000 ක චෙක්පතට අදාළ ගෙවීම් විස්තර, ආදායකයාගේ නම, ලිපිනය ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 50 කට 2016 ජුනි 27 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.104,759,526 ක් වී තිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

----------------

**3.3.1 අයවැය විචලනය**

------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් සලසාගෙන තිබුණු රු.1,005,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**3.3 .2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන**

----------------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා එවා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 නොවැම්බර් 26 දිනැති අංක 1/2016 දරන ජාතික ප්‍රතිපාත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් එකතුව රු.3,004,237 ක් වැය කර තිබුණි.

| **කාරණය**<br>--------- | **වියදම**<br>-------<br>රු. |
|---|---|
| ඌව පළාත් සභාවට අයත් පාසල් 12 ක අලුත්වැඩියා කටයුතු | 1,209,644 |
| බිබිල, මොනරාගල, තණමල්විල, කතරගම, සෙවනගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් | 1,494,593 |

| | |
|---|---|
| පෙර පාසල් ළමුන් පෞද්ගලිකව පරිහරණය කරන භාණ්ඩ ලබාදීම | |
| බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තරුණ තරුණියන්ට ටී ෂර්ට් ලබාදීමට | 300,000 |
| | ------------ |
| **එකතුව** | **3,004,237** |
| | **=======** |

(ii) 2015 නොවැම්බර් 26 දිනැති අංක 1/2016 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුකූල නොවී විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ මිලදී ගෙන තිබුණු රු.1,298,604 ක් වටිනා භාණ්ඩ ඒකක 7,582 ක් විගණන දිනය වූ 2017 ජනවාරි 31 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

(iii) විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලන වියදම් වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් එම වැඩසටහනට අදාළ නොවන වියදම් වෙනුවෙන් රු.498,380 ක් වැයකර තිබුණි.

(iv) විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ 2013 හා 2014 වර්ෂවල බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදීගෙන තිබුණු රු.716,020 ක් වටිනා භාණ්ඩ ඒකක 284 ක් විගණන දිනය වූ 2016 දෙසැම්බර් 14 දින වන විටත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-----------------------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) සෙවනගල දිවිනැගුම ප්‍රජාමූල බැංකුව විසින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ 2016 ජූලි 13 දින ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ලබා දී තිබුණු රු.325,000 ක ණය මුදල්වලින් ණය වාරික හෝ පොලී කිසිවක් අයවී නොතිබුණි.

(ii) සෙවනගල දිවිනැගුම ප්‍රජාමූල බැංකුව විසින් ප්‍රතිලාභීන් 12 දෙනෙකු වෙත 2015 අප්‍රේල් 29 වන දින සිට 2016 ජූලි 28 දින දක්වා නිකුත් කර තිබුණු රු.3,550,000 ක ණය මුදල් වලින් රු.3,491,537 ක් හෙවත් සියයට 98.35 ක් 2016 දෙසැම්බර් 27 විගණන දින වන විටත් අයවී නොතිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අදාලව වර්ෂ 02 ක් ඉක්මවූ රු.24,299,429 ක් වූ කොන්ත්‍රාත් තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව ස්ථානමාරුවී ගිය, මිය ගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ට අදාළව අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,500,855 ක් විය. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

### 3.6.1 අභ්‍යන්තර විගණනය

-----------------------

මුදල් රෙගුලාසි 133(2)(අ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අදාළව අභ්‍යන්තර විගණන වාර්තා 17 ක් පමණක් නිකුත් කර තිබුණු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත් කර නොතිබුණි.

### 3.6.2 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------

2016 ජනවාරි 28 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් විගණන හා කළමනාකරණ කමිටුව සැලකිල්ලට ගත යුතු කරුණු 19 ක් දක්වා තිබුණු අතර, එම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

--------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් අවුරුදු 02 ½ ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

කතරගම, මැදගම හා වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් වර්ග 10 කට අයත් භාණ්ඩ ඒකක 68 ක ඌනතා දක්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) හා (3) පරිදි කටයුතු කර නොතිබුණි.

## 3.8 බේරුම් නොකළ බැරකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් ශේෂය රු.364,182 ක් වූ අතර එම මුළු බැරකම් වටිනාකම වර්ෂයකට වඩා අඩු කාල පරාසයක් ගෙන තිබුණි.

## 3.9 අනුකූල නොවීම

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | - | අනතුරු සිදුවී වර්ෂ 01ක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණු වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පූර්ණ වාර්තා පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 137 | 530,815 | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනුමත නොකළ ගෙවීම් වවුචර් දෙකක් සඳහා ගෙවීම් කර තිබුණි. එම ගෙවීම් සඳහා නිකුත් කළ චෙක්පත් දෙක |

| | | | |
|---|---|---|---|
| | | | මාස 6 කට වැඩි කාලයක් අත රඳවා ගෙන සිට 2017 ජූනි 12 දින රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 215(3)(ඇ) | 142,000 | මොණරාගල හා සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2015 වර්ෂයේදී රු.142,000 ක් භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා නොගෙන වියදමක් ලෙස ගිණුම්ගත කර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

**(ආ) කොන්ත්‍රාත් වෙනුවෙන් බදු ගෙවීම්**

**--------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතු කළ අගය මත බදු සඳහා වලංගු ලියාපදිංචියක් නොමැති කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2014 හා 2015 වර්ෂවලදී රු.2,036,250 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි.

## 3.10 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**--------------------------------------------------------**

දේශීය මූල්‍යකරණයන් යටතේ වූ ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

**(අ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**--------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම යටතේ පානීය ජල ව්‍යාපෘති 03 ක මූලික අදියර සඳහා රු.3,679,240 ක් වැය කර තිබුණි. ප්‍රතිලාභීන් 1398 කට ජල පහසුකම් සැපයීමේ අරමුණින් ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතිවල දෙවන හා අවසාන අදියරයන් 2015 හා 2016 වර්ෂයවලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසවල වැටවල් සකස් කිරීම සඳහා අවශ්‍ය කටුකම්බි, කොන්ක්‍රීට් කම්බි කණු හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා රු.391,075 ක් වැය කර තිබුණි. එම භාණ්ඩ මිලදී ගැනීමට පෙර කාර්මික නිලධාරී ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර, විගණන දිනය වූ 2017 මාර්තු 20 දින වන විටත් රු.191,250 ක් වටිනා කොන්ක්‍රීට් කම්බි කණු 255 ක් කාර්යාලය වෙත ලැබී නොතිබුණි.

(iii) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ පුංචිවැව වසමේ උස්වාරි ජල යෝජනාක්‍රමය සඳහා රු.399,976 ක වටිනාකමින් යුත් වතුර මෝටරයක් සහ අවශ්‍ය අනෙකුත් උපාංග ලබාදී තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන දෙකක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින රු.1,077,500 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. විගණන දිනය වූ 2017 මාර්තු 16 දින වන විටත් වාහන දෙක අලුත්වැඩියා කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත බාරදී නොතිබුණි. අදාළ පෞද්ගලික ආයතනය වෙත ලබා දී තිබුණු චෙක්පත 2017 පෙබරවාරි 27 දින බැංකුවට ඉදිරිපත් කර මුදල් ලබාගෙන තිබුණි.

## 3.11 කාර්යසාධනය

---

2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. .

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකල ප්‍රධාන කාර්යයන්**

---

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු.400,017 ක් කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වැය නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් හතර දෙනෙකුගේ විදේශ සංචාර සඳහා වැයකර තිබුණි.

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු නොකිරීම**

---

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංශ 05 ක් විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු ක්‍රියාකාරකම් 40 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ක්‍රියාකාරකම් 13 ක් ඉලක්කගත මට්ටමට වඩා අඩුවෙන් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහනයක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂාවේදී ලීටරයකින් කිලෝමීටර් 10.02 ක් ධාවනය කළ හැකි බව අනාවරණය වී තිබුණි. ඉන්ධන ලීටරයකින් කිලෝමීටර් 7 ක් ධාවනය කළ හැකි ලෙස ලබාගත් ඉන්ධන තුලනය කරන ලෙස මෝටර් රථ පරීක්ෂක නිර්දේශ ලබා දී තිබීම හේතුවෙන් 2014 ජූනි මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා ඉන්ධන ලීටර් 5840 ක් වැඩියෙන් වාහනයට නිකුත් කර තිබුණි.

(ආ) බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රජයේ කැලෑ හෙක්ටයාර් 200 ක භූමි ප්‍රමාණයක් සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ කැලෑ හෙක්ටයාර් 400 ක භූමි ප්‍රමාණයක් බුත්තල පිහිටි පුද්ගලික සමාගමක් විසින් 2010 වර්ෂයේ සිට අනවසරයෙන් සන්තකයේ තබාගෙන තිබුණි. පසුව එම සමාගම විසින් කෙසෙල් වගා කිරිම සඳහා තවත් සමාගමක් වෙත ගිවිසුමක් මගින් එම ඉඩම් පවරා දී තිබුණි.

## 3.13 අවිධිමත් ගනුදෙනු

--------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන කමිටුවේ තෙවන සාමාජිකයා ප්‍රසම්පාදන අස්ථිත්වයට පරිබාහිර අයෙකු විය යුතු වුවද, එයට අනුකූල නොවී තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් ප්‍රසම්පාදන කමිටුවක් විසින් රු.9,067,855ක් වටිනාකමින් යුත් ප්‍රසම්පාදන තීරණ 34 ක් ගෙන තිබුණි.

(ආ) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයේ ප්‍රසම්පාදන තීරණ දෙකක් මගින් වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ රු. මිලියනයක අධිකාරී සීමාව ඉක්මවා අවස්ථා දෙකකදී රු.3,428,005 ක් හා රු.1,402,500 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ඇ) 2016 මැයි 01 දින සිට 2017 අප්‍රේල් 30 දින දක්වා කාලයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් සඳහා ආරක්ෂක සේවා සැපයීමට ආයතනයක් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර රු.9,541,800 ක ගිවිසුම්ගත මුදලකට රාජ්‍ය ආයතනයක් වෙත පවරා තිබුණි. පසුගිය කාල පරිච්ඡේදය සඳහා ආරක්ෂක සේවා සැපයීමට ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණු අතර, ඔවුන් වෙත රු.6,249,600 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර කටයුතු කිරීම නිසා සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාළ ආරක්ෂක සේවා සැපයීමේ වියදම ඉකුත් කාල පරිච්ඡේදයට වඩා රු.2,823,318 කින් වැඩි වී තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මොණරාගල දිවා සුරැකුම් මධ්‍යස්ථානයට අවශ්‍ය විවිධ උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.768,080 ක් ගෙවා තිබුණි. ඊට අදාළව සිදුකළ භෞතික පරීක්ෂාවේදී මිලදීගෙන තිබුණු රු.333,770 ක් වටිනා උපකරණ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව මිලදී ගැනීමට තීරණය කළ උපකරණ වර්ගයන්ගෙන් සපයා නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 05 ක් සඳහා නව තාක්ෂණය සහිත විද්‍යුත් උපාංග සවිකිරීම වෙනුවෙන් රු.423,079 ක් වැයකර තිබුණු නමුත්, විගණන දිනය වූ 2017 මාර්තු 20 දින වන විටත් එම සවිකල උපකරණ ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

(ඊ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දහම් පාසල් වෙත බෙදාදීම සඳහා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.399,960 ක් ගෙවා තිබුණු අතර මිලදී ගැනිම තීරණය කර තිබුණු උපකරණ වර්ගයට වෙනස් උපකරණ සැපයුම්කරු විසින් සපයා තිබුණි.

## 3.14 වංචනික ස්වරූපයේ ගනුදෙනු

--------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සෙවනගල දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ ජීවනෝපාය සංවර්ධන ණය ලබාදීම් යටතේ රු.25,000 ක ණය මුදලක් වෙනුවෙන් පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව රු.300,000 ක ණය මුදලක් නිකුත් කර තිබුණි. ඉන් රු.275,000 ක් බැංකුවේ වෙනත් නිලධාරියකු විසින් ලබා ගෙන තිබුණි.

(ආ) සෙවනගල දිවිනැගුම ප්‍රජාමූල බැංකුව විසින් රු.50,000 ක ණය මුදලක් ඉල්ලා තිබුණු ණය ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත බැංකුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. පසුව එම ණය ඉල්ලුම්කරුවකුගේ නමින් රු.250,000 ක ණය මුදලක් නිකුත් කර තිබුණද, එම ණය මුදල ණය ඉල්ලුම්කරු ලබාගත් බව තහවුරු වී නොතිබුණි.

(ඇ) සෙවනගල දිවිනැගුම ප්‍රජාමූල බැංකුව විසින් රටවිරු ණය වැඩසටහන යටතේ ණය නිකුත් කිරීම සම්බන්ධයෙන් සපුරාලිය යුතු මූලික අවශ්‍යතා නොමැතිව, ප්‍රතිලාභීන්ගේ අත්සන් යොදා ප්‍රතිලාභීන් 04 දෙනෙකුගේ නමින් රු.900,000 ක ණය මුදල් නිකුත් කර තිබුණද, එම ණය මුදල් අදාළ ප්‍රතිලාභීන් වෙත ලැබී නොතිබුණි.

## 3.15 වැඩිපුර ගෙවීම්

----------------

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව නිරීක්ෂණය වු වැඩිපුර ගෙවීම් පහත දැක්වේ.

(අ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කර්මාන්ත 08 ක් සඳහා ගෙවීම් කිරීමේදී, ඉටු නොකළ වැඩකොටස් සඳහා රු.222,423 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කර්මාන්ත 39 ක් සඳහා ගෙවීම් කිරීමේදී, යන්ත්‍ර මිශ්‍රණ රේටය යොදා නොගැනීම, හැඩයම් ලෑලි සඳහා නියමිත රේටය යොදා නොගැනීම, ABC සඳහා ගෙවීම් කිරීම, පස් කැපීම් වෙනුවෙන් වැරදි රේටයක් යොදා ගැනීම හා පස් ප්‍රවාහනය සඳහා නියමිත රේටය යොදා නොගැනීම යන කාර්යයන්ට අදාළව රු.1,054,354 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.16 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස තක්සේරුකර නව තක්සේරු වාර්තාවක් ලබා දී තිබියදී, ඒ අනුව නව තක්සේරු කුලී අයකිරීමට කටයුතු නොකර 2010 වර්ෂයේ තක්සේරු වාර්තාව පදනම් කරගෙන කුලී අයකිරීමට කටයුතු කිරීම නිසා රු.608,225 ක් අඩුවෙන් නිවාස කුලී අයකර ගෙන තිබුණි.

(ආ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අංක 04 දරන පරිපාලන නිලධාරී රජයේ නිවස වෙනත් ආයතන දෙකක් පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණද, එම රජයේ නිවස වෙනුවෙන් අයවිය යුතු රු.362,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ සිට 2014 ජනවාරි මාසය දක්වා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී රජයේ නිවාසයේ පදිංචි වී සිටි නිලධාරියාගෙන් කුලී අයකිරීමේදී රු.117,634 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ඈ) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාසික ආදායම් සහතික නිකුත් කිරීමේදී ආදායමින් සියයට 1.265 ක් අයකළ යුතු වුවත්, සියයට 01 ක් පමණක් අයකිරීම නිසා රු.59,326 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද, ව්‍යාපෘති 03 කින් රු.47,157 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

## 3.17 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වාදුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2006 | 8.7.2 (අ)(i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 හා 3.9.2 මාර්ගොපදේශ අනුගමනය නොකර, තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,950,000 ක් වියදම් කර අලෙවි කුටි 26 ක් ඉදිකිරීමේදී උප කොන්ත්‍රාත්තුවක් ලබා දීම. |
| 2008 | 10.4 (ඉ)(i) | 2006/2007 වර්ෂවල ගම නැගුම වැඩසටහන යටතේ බෝපිටිය, තෙනගල්ලන්ද, වෙහෙරගල හා කහම්බාන ජන සභා කාර්යාල ඉදිකිරීමේදී සිදුවී තිබුණු අඩුපාඩු හා අක්‍රමිකතා |
| 2010 | 4.1(i) | 2002 වර්ෂයේදී වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයකට සිදුවී තිබුණු අනතුර වෙනුවෙන් රු.375,000 ක අලාභය අයකර ගැනීම |

## 3.18 කළමනාකරණ දුර්වලතා

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂණවලදි පහත සඳහන් දුර්වලතා නිරික්ෂණය විය.

(i). කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 03 දරන සාද නිවාසය 2001 වර්ෂයේ සිට තක්සේරු කිරීමකින් තොරව රු.100 ක මාසික කුලියකට වර්ෂ 15 කට අධික කාලයක් එකම නිලධාරියකුට පදිංචිය සඳහා ලබා දී තිබුණි.

(ii). මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී තනතුරෙහි නිත්‍ය රාජකාරිවලට අමතරව මොණරාගල දිස්ත්‍රික් මහා රෝහලේ ගණකාධිකාරී තනතුරෙහි රාජකාරී ඉටු

කිරීම වෙනුවෙන් එකම දිනයන් තුළ දින 45 ක් සඳහා ආයතන දෙකෙන්ම රු.22,500 ක සංයුක්ත දීමනා ලබාගෙන තිබුණි.

**3.19 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 35 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 24 | 07 | 17 |
| (iii) | ද්විතියික මට්ටම | 741 | 657 | 84 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 110 | 96 | 14 |
| | **එකතුව** | **915** | **795** | **120** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කතරගම, මඩුල්ල හා බඩල්කුඹුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන් 44 දෙනෙකු වර්ෂ 07 ක සිට වර්ෂ 25 ක් දක්වා දීර්ඝකාලීනව ස්ථාන මාරුවීමකින් තොරව එකම කාර්යාලයේ සේවයේ යොදා ගෙන තිබුණි.

(ආ) බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර වර්ෂ 07 ක සිටද, කාර්මික නිලධාරී තනතුර වර්ෂ 15 ක සිටද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර වර්ෂ 07 ක සිටද පුරප්පාඩුව පැවතුණි.

(ඇ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු හා සන්නිවේද තාක්ෂණ සහකාර තනතුර වර්ෂ 10 ක සිටද, පරිපාලන නිලධාරී තනතුර වර්ෂ 09 ක සිටද, පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර වරශ 04 ක සිටද, සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර වර්ෂ 02 ක සිටද පුරප්පාඩුව පැවතුණි.